# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2012.12.24 |
| **වේලාව** | : | පෙ.ව. 09.30 |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | ගරු නාගරික මනත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

- ගරු නාගරික මන්ත්‍රී, අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා හට මෙදින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බැවින් නිවාඩු ලබා දෙන මෙන් ඉල්ලා ලිපියක් එවා තිබූ අතර, එම නිවාඩු අනුමත කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**නිලධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එම්. එච්. සීලවතී මිය |

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

සභා රැස්වීම් වාර්තාව සම්බන්ධව වෙනත් අදහස් දැක්වීම් නොවූ බැවින් එය කියවූ ලෙස සලකා මහා සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මේ පවත්වන්නට යෙදෙන්නේ 2012 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී. එමෙන්ම බ්‍රහස්පතින්දා පෝය නිවාඩුව සහ අඟහරුවාදා දිනයේ නත්තල් නිවාඩුව යෙදී ඇති බැවින් මෙම මාසයේ සඳුදා දින මහා සභා රැස්වීම පැවැත්වීමට සිදුවූ බව ද, ඒ හේතුවෙන් ගරු මන්ත්‍රීතුමන්ලා යම් අපහසුතාවයකට පත් වූයේ නම් සමාව අයදින බව ද එතුමා ප්‍රකාශ කළේය. එමෙන්ම, 2013 වසරේ සිට මහා සභා රැස්වීම සෑම මාසයකම අවසාන අඟහරුවාදා දිනයේ පැවැත්වීමට කටයුතු කරන බව ද, උත්සව අවස්ථා ආදිය නොයෙදෙන එම දිනය ඒ සඳහා ඉතාමත් සුදුසු බවට ද වැඩිදුරටත් සඳහන් කරන ලදී.

පසුගිය මහා සභා රැස්වීමේ දී සම්මත කරගන්නා ලද අයවැය කෙටුම්පත අයවැය ලේඛනයක් වශයෙන් මේ සභා වාරයේ දී ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දෙන බව ද එතුමා දන්වන ලදී. එම අයවැය ලේඛනය සියළුම අංශයන් කෙරෙහි අවධානය යොමු කරමින් සකස් කරන ලද බවද එතුමා සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් සභාව අමතමින්, මෙම සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඇතුළු සියළු දෙනා ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 සී/ස බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය රැක ගැනීම සඳහා සහයෝගය ඉල්ලීම

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා විසින් යොමු කර තිබූ ඉහත මාතෘකාවට අදාල ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම කරුණ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් හෝ යෝජනා ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය

### 06:02 බස් නැවතුම්පොල වැසිකිළි ඉවත් කර සෑදූ කඩකාමර බදු දීම

2012 සැප්තැම්බර් මස මහා සභා වාර්තාවේ 06:07 ඡේදයේ බස්නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ වැසිකිළි ඉවත් කර කඩ කාමර සකස් කිරීමට තීරණය කර ඇත. මෙම කඩ කාමර 2013 ජනවාරි මාසයේ සිට බදු දීම සඳහා තීරණයක් ගැනීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, මාස 06ක තැන්පත් මුදල් සහ විදුලිය සඳහා රු. 10,000.00ක තැන්පත් මුදල් ලබාගෙන, පහත මාලයේ සකස් කරන ලද සී - 18ඒ කඩ කාමරය සඳහා රු. 4,000.00ක් ද, සී - 5ඒ කඩ කාමරය සඳහා රු. 5,000.00ක් ද, ඉහල මාලයේ සකස් කරන ලද කඩ කාමරය සඳහා රු. 4,000.00ක් ද අය කිරීමට මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:03 කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් ලබා ගැනීම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ බළන්ගොඩ උප කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් ලබා දෙන මෙන් ඉල්ලමින් බළන්ගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරී විසින් යොමු කර තිබූ ලිපියක් ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ සඳහා ලබා දීමට සුදුසු ස්ථානයක් මෙම සභාව සතුව නොමැති බව දන්වා යැවීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:04 බලන්ගොඩ බස්නැවතුම්පොල පරිශ්‍රය තුළ ගුවන් විදුලි මධ්‍යස්ථානයක් ලබා දීම**

බලන්ගොඩ බස්නැවතුම්පොල සහිත වෙළඳ සංකීර්ණය තුළ ගුවන්විදුලි විකාශනයක් සිදු කිරීම සඳහා කලින් පොලිස් නිලධාරීන් සඳහා වෙන් කර තිබූ කාමරය ලබා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙළඳ දැන්වීම් ප්‍රචාරය කරන්නේ නම් මුදල් අය කර ගැනීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:05 බස් නැවතුම්පොල බී - 03 කඩ කාමරයේ අයිතිය පැවරීම**

දැනට පලනියාර් සින්නප්පු කන්දයියා මහතා වෙත පවරා ඇති බස්නැවතුම්පොල බී - 03කඩ කාමරය පටබැඳිගේ ඉසුරු ලක්මාල් කුරේ යන අය වෙත පවරා දීමට මහා සභාව වෙත සිදු කරන ලද ඉල්ලීම් ලිපියට අනුව අදාල අයගෙන් 25% ප්‍රමාණයක් සභාව වෙත අය කර පවරා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ අංක සී-48 හා 49 දරන කඩ කාමර සඳහා මුදල් නොගෙවීම**

බස් නැවතුම්පොලහි සී-48 හා 49 කඩ කාමර සඳහා 2012 වර්ෂයට අයවිය යුතු රු. 96,240.00ක මුදල ගෙවා නොමැති බව දන්වන ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා කාරක සභා අවස්ථාවක් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවේ දී කරුණු දක්වමින් ආදායම් පරීක්ෂක මහතා විසින් දන්වා සිටියේ සභාව පැවැත්වෙන දිනයේ උදෑසන අදාල ගෙවීම් සිදු කර ඇති බවයි.

**06:07 පෞද්ගලික බස් බඳු අයකරු 2012.08.09 වන දින සේවයට වාර්තා නොකිරීම**

පෞද්ගලික බස් බඳු අයකරු එම්. ජී. පියසේන මහතා තම පියාගේ අවමංගල්‍යය හේතුවෙන් 2012.12.08 හා 2012.12.09 දෙදින සේවයට වාර්තා නොකළ බව දන්වමින් එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම දින අදාල ගාස්තු වලින් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 වරිපනම් අංක 47, 49 1/1, 45 1/1 නිවාස සඳහා 2013 වර්ෂයට බදු සහන ලබා ගැනීම**

වරිපනම් අංක 47, 49 1/1, 45 1/1 නිවාස සඳහා 2013 වර්ෂයට බදු සහන ලබා ගැනීම සඳහා සභාව වෙත එවා තිබූ ලිපිය අනුව 50%ක් බදු සහන ලබා දීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 කාර්යාල ගොඩනැගිලි සහ නගර සභාව සතු සියළු ගොඩනැගිලි 2013 වර්ෂය සඳහා රක්ෂණය කිරීම**

2013 වර්ෂය සඳහා පහත දැක්වෙන ගොඩනැගිලි රක්ෂණය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

- නගර සභා ගොඩනැගිල්ල
- පුස්තකාල ගොඩනැගිල්ල
- පෙර පාසැල් ගොඩනැගිල්ල
- තානායම් ගොඩනැගිල්ල
- බස් නැවතුම්පොල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල
- පොදු වෙළඳ සැල
- බැංකියවත්ත ගොඩනැගිල්ල

එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස ඉදිරිපත් නොවූ බැවින්, මේ සඳහා රක්ෂණ ආයතන වලින් මිල ගණන් කැඳවීමට තීරණය කරන ලදී.

## පසුව ලැබෙන ලිපි

**06:10 2013 වර්ෂය සඳහා වන සැපයුම්කරුවන්ගේ ලේඛනය**

2013 වර්ෂය සඳහා වන සැපයුම්කරුවන්ගේ ලේඛනය සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 2013 වර්ෂය සඳහා 10%කින් වැඩි කරන ලද කඩකුලී සංශෝධනය කිරීම**

2013 වර්ෂය සඳහා 10%කින් වැඩි කරන ලද කඩකුලී නැවත සංශෝධනය කරන මෙන් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් සහ වෙළඳසැල් හිමියන් විසින් ඉල්ලා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කළේය.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම වැඩි කරන ලද කඩකුලී ප්‍රමාණය 5% ක් වන ලෙස සංශෝධනය කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:11 කොම්පෝස්ට් ව්‍යාපෘතියේ නිෂ්පාදනය සහ අලෙවිය සම්බන්ධ වාර්තාවක් ලබා ගැනීම**

කොම්පෝස්ට් ව්‍යාපෘතියේ නිෂ්පාදනය කරන පොහොර ප්‍රමාණය, අලෙවි කරනු ලබන ප්‍රමාණය, පොහොර හා ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ද්‍රව්‍ය විකිණීමෙන් ලබන ආදායම අදිය සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම අනුව අදාල වාර්තාවක් ලබා ගැනීම කළ යුතු යැයි ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙතින් එම වාර්තාව ලබා ගැනීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:12 බංගලාදේශ රාජ්‍යතාන්ත්‍රික දූත පරිස - ක්ෂේත්‍ර චාරිකාව**

2013.01.04 වන දින මෙම සභාව සහ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය නිරීක්ෂණය සඳහා බංගලාදේශ රාජ්‍යතාන්ත්‍රික දූත පිරිසක් පැමිණෙන බවට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**06:13 බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රයක් (Multy Media Projector) යන්ත්‍රයක් ලබා ගැනීම**

2012.12.16 සහ 2012.12.23 යන දිනයන්හි මෙම සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීමට නියමිත වැඩමුළුව සඳහා අවශ්‍ය බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය කැඩී ඇති බවත්, එය අලුත්වැඩියා කිරීමට අදාල කොටස් මෙරට නැති බැවින් ඒවා ගෙන්වා ගැනීමට මාස 03ක් පමණ ගතවන බැවින් නව බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රයක් හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා මිල දී ගැනීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 පාර කපන විට කැඩී ගිය නිවස සාදා ගැනීමට ආධාර ඉල්ලීම**

එල් 20, බැංකියවත්ත, තුඹගොඩ, බළන්ගොඩ යන ස්ථානයේ පදිංචි පී. එම්. නන්දාවති මහත්මියගේ නිවස පාරක් සෑදීමේ දී කැඩී ගිය බවත් එම නිවස සාදා ගැනීමට ආධාර අවශ්‍ය බවත් දන්වමින් එම මහත්මිය විසින් යොමු කරන ලද ලිපිය සහ අදාල ග්‍රාම නිලධාරී සහතිකය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිරපත් කරන ලදී.

අදාල ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට මහා සභාවේ දී තීරණය කරන ලදී.

**06:15 බළන්ගොඩ තානායමේ ළිඳ අලුත්වැඩියා කිරීම**

බළන්ගොඩ තානායමේ ඇති ළිඳ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය බැවින් සිලින්ඩර දමා, කඩා වැටී ඇති මෝටරය යලි සකස් කර ගැනීම සඳහා ගාස්තුව වශයෙන් රු. 48,000.00ක මුදලක් වැය වන බව තානායම් කළමනාකරු විසින් දන්වා ඇති අතර, ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, ළිඳ අලුත්වැඩියා කිරීම මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:16 සුළු වෙළඳාම සඳහා කඩකාමරයක් ලබා ගැනීම**

බස්නැවතුම්පොල සී-23 කාමරය ආසන්නයේ පඩිපෙල අසල ස්ථානය දොරක් සාදා කඩකාමරයක් ලෙස භාවිතයට ගැනීමට කේ මොනී කල්දේරා නම් පුද්ගලයා විසින් ඉල්ලීමක් කර ඇති බව දැන්වූ ගරු සභාපතිතුමන් එම ඉල්ලීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 උඩ ඇල්ලෙපොල කොට බෝධිය අසළ මාර්ගය සම්බන්ධ ලිපිය**

උඩ ඇල්ලෙපොල කොට බෝධිය අසල මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් පිරිසකගේ අත්සන් සහිතව දර්ශන විපුලසිරි නමැත්තා විසින්

එවා ඇති ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**06:18 බෝම්බුව පෙර පාසැලට පාලිකාවන් බඳවා ගැනීම**

අළුතින් ඉදිකරන ලද බෝම්බුව ප්‍රජා ශාලාවේ ආරම්භ කිරීමට නියමිත පෙර පාසැල සඳහා සිංහල සහ දෙමළ මාධ්‍ය පාලිකාවන් දෙදෙනෙකු බඳවා ගැනීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව එම බඳවා ගැනීම සිදු කිරීමටමහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව එහි අනුමත වී ඇත.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

**08:01 පෙට්ටිගල මාර්ගයේ බෝධිමණ්ඩලාරාම විහාරස්ථානය ඉදිරිපිට පැතිබැම්ම ඉදි කිරීම**

පෙට්ටිගල මාර්ගයේ බෝධිමණ්ඩලාරාම විහාරස්ථානය ඉදිරිපිට පැතිබැම්ම ඉදිකිරීම කර්මාන්ය සඳහා වන ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

නැත

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

නැත

## 11. යෝජනා

**11:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

1. අබලන් වී ඇති මාර්ග පද්ධතිය නැවත ප්‍රතිසංස්කරණය කිරීම
2. සභාවට ගල් රෝල ලබා ගැනීම යෝජනා ස්ථිර වුවත් එම ප්‍රමාදය පිළිබඳව සිහිකැඳවීම
3. පොදු වෙළඳසැල සිටින අයට (ව්‍යාපාරික) සනීපාරක්ෂාව සඳහා පොදු වැසිකිළි නැවත ප්‍රතිසංස්කරණය කිරීම

ඉහත යෝජනාවන් සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් යෝජනා කළ අතර. එම යෝජනාව ගරු උපසභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව, අබලන් වී ඇති මාර්ග පිළිසකර කිරීම දැනටමත් ආරම්භ කර ඇති බවත්, එම කටයුතු ලබන අප්‍රේල් මාසය වන විට අවසන් කිරීමට හැකි වනු ඇති බවටත් ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ගල් රෝල මිල දී ගැනීම සඳහා අදාල ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවීමටත්, පොදු වැසිකිළියේ සනීපාරක්ෂක කටයුතු

නඩත්තු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනයන්ගෙන් සිදු කිරීමටත් මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

4. බළන්ගොඩ නගරයේ හා අවට පාරිභෝගිකයන් සඳහා ඌරු මස් ලබා ගැනීම සඳහා සුදුසු ස්ථානයක් ලබා දීම

මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් වෙනස් අදහස් ඉදිරිපත් වූ බැවින් ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් විමසීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර ගරු මන්ත්‍රීතුමන්ලා වෙතින් අදහස් විමසන ලදී.

***4.1 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

මෙම යෝජනාව කාලෝචිත බව පෙනුනු නිසා සභාවට ඉදිරිපත් කිරීම සඳහා ගරු සභාපතිතුමන් වෙත යොමු කළා. ඌරු මස් තැන් තැන් වල තිබුණත් සභාවේ අවසරය මත එසේ වෙළඳ සැලක් ආරම්භ කිරීම කළ යුතුයි.

***4.2 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා***

මෙම යෝජනාවට මම තදින්ම විරුද්ධ වනවා. බළන්ගොඩ නගරයේ මුස්ලිම් ජනතාව විශාල ප්‍රමාණයක් සිටිනවා.

***4.3 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

මේ ඌරු මස් කඩයක් බළන්ගොඩ නගරයේ විවෘත කිරීමට යෝජනා වූ තුන්වන අවස්ථාව වන අතර ගරු උප සභාපතිතුමන් විසින් එය සිදු කරන ලද දෙවන අවස්ථාවයි. මේ නගරය සිංහල දෙමළ හා මුස්ලිම් ජනතාව සහයෝගයෙන් ජීවත් වන නගරයක්. මෙම කාරණය ඇතැම් අවස්ථාවල දී දේශපාලන වාසි ලබා ගැනීමට පවා කටයුතු කළ අවස්ථාවන් තිබෙනවා. ආගම කවරක් වුවත්, ඌරු මස් සම්බන්ධව වෛද්‍ය විද්‍යාත්මකව බැලුවොත් එහි විශබීජ නැති කිරීමට නොහැකි සහ රෝග කාරක තිබෙන බව දැක්වෙනවා. මෙවන් වෙළඳසැලක් නගර සභාවේ පොදු වෙළඳසැල තුළ ආරම්භ කිරීම විරුද්ධ වනවා.

***4.4 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා***

මුස්ලිම් ජාතික ගරු මන්ත්‍රීතුමන්ලා කියන කතාව ඔවුන්ගේ පැත්තෙන් බැලුවොත් සාධාරණයි. මින් පෙර ගව මස් කඩ සම්බන්ධ ගැටලුවක් ඇති වූ අවස්ථාවක දී එය මුස්ලිම් ජනතාවගේ පාරිභෝගික අයිතිය සුරක්ෂිත කිරීම සඳහා තිබිය යුතු බැවින් එය අප විසින් අනුමත කරනු ලැබුවා. මෙම අවස්ථාවේ දී සභාව තුළ ජනවර්ග ගැටෙන අවස්ථාවක් ඇති නොවන ලෙස, සියළු දෙනා සහෝදරත්වයෙන් ජීවත් වන නගරයක් වශයෙන් සියළු ජනයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් මෙම යෝජනාව ක්‍රිස්තියානි ජනතාවගේ පැත්තෙන් සාධාරණ බව අනුමත කරන අතරම මුස්ලිම්

ජනතාවගේ පැත්තෙන් අසාධාරණ බව පිළිගන්නවා. මෙම යෝජනාව සලකා බැලීමට තව කල් ගැනීම සුදුසු බව සිතනවා.

*4.5 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා*

මස් ඇත පව් නැත යනුවෙන් කතාවක් තිබෙනවා. හැම ජීවියෙක්ගෙම ප්‍රාණය එක සමානයි. කොයි මස කෑවත් එකම පවයි ඇත්තේ. කෙසේ වෙතත් උප සභාපතිතුමාගේ යෝජනාව සම්බන්ධව නම් බළන්ගොඩ නගරයේ වැඩි ප්‍රමාණයක් මුස්ලිම් ජනතාව සිටිනවා. මේ ගැන පසුව සලකා බැලිය යුතුයි. මෙම අවස්ථාව ජාතින් අතර සමගිය බිඳ නොදැමීම පිණිස මෙම යෝජනාව හකුලා ගත යුතු යැයි සිතනවා.

*4.6 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා*

ශ්‍රී ලංකාවේ බෞද්ධයින් වැඩි ප්‍රමාණයක් ගවයන් මස් පිණිස මැරීමට අකැමතියි. එයට විරුද්ධව භික්ෂූන් වහන්සේලා සහ බෞද්ධ ජනතාව පෙළපාළි ගියත් ඌරන් මැරීමට විරුද්ධව එවන් විරෝධතාවක් දැක ගැනීමට නෑ. මම එක් ජනකොටසක් ප්‍රාණ ඇපයේ තබාගෙන ඡන්ද ලබා ගන්නේ නෑ. අද ලෝකයේ වැඩියෙන්ම පාවිච්චි කරන්නේ ඌරු මස්. මගේ යෝජනාව ප්‍රතික්ෂේප වුවත් ඒ ගැන තරහක් නැ. මා සභාපති තනතුරේ සිටියා නම් මෙම වෙළඳ සැල ආරම්භ කරනවා. එය කාගේවත් වෛරය පිරිමැසීමට කරනවා නොවෙයි. මෙසේ ඡන්ද පදනම ගැන සලකා අපගේ පක්ෂය හෝ ජාතිය පාවා දීමට කටයුතු නොකරන බව මෙම ගරු සභාවට කියා සිටිනවා.

*4.6 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා*

මෙම යෝජනාව කාලයාට විසඳීමට තැබීම සුදුසුයි. එබැවින් ගරු උප සභාපතිතුමාගේ යෝජනා 04න් මුල් යෝජනා තුන මහා සභාවේ සම්මත වුවත් ඌරු මස් වෙළඳසැල සම්බන්ධ යෝජනාව ඉදිරි කාලයේ දී සංවාදයට ගැනීමට තැබිය යුතු බව සිතනවා.

*4.7 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා*

සියලු ජනතාවට සමාන අයිතිවාසිකම් තිබිය යුතුයි. මස් කඩ විවෘත කරනවා නම් සියලුම මස් කඩ විවෘත කිරීමට හැකි විය යුතුයි. එසේ නොමැති නම් සියලු මස් කඩ වසා දැමිය යුතුයි. මා බෞද්ධයකු වශයෙන් සතුන් මැරීමෙන් සහ මස් කෑමෙන් වැලකී සිටින්නේ. ඒ නිසා පෞද්ගලිකව සියලු මස් කඩ වසා දමනවා නම් කැමතියි.

මෙම කරුණු සලකා බලා ඌරු මස් වෙළඳ සැල සම්බන්ධව ලබන වර්ෂයේ දී මස් කඩ ටෙන්ඩර් කිරීමට අදාලව සලකා බැලීමට තීරණය විය.

**11:02 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

1. බස්නැවතුම්පොල තුළ පිහිටි අනවශ්‍ය වැසිකිළි ඉවත් කර ඒවා වෙළඳසැල් බවට පත් කර මාසික කුලී පදනම මත බදුදීමට තීරණයක් ගෙන ඇති බැවින් එම මාසික පදනම මත අයකරන කුලී ප්‍රමාණය තීරණය කිරීම.
2. එක් මන්ත්‍රීවරයකු වෙත 2013 වර්ෂය තුළ වෙන්වන මුදලින් සියලු මන්ත්‍රීතුමන්ලාගේ එකතුවෙන් රු. 500,000.00ක් වියදම් කර මහජන පොල ඉතිරි කඩකාමර 21ක් සෑදීම.
3. 2013 වර්ෂයේ අයවැයෙන් එක් මන්ත්‍රීවරයකුට ලැබෙන මුදලින් පළමු යෝජනාව ලෙස බාන්ස් රත්වත්ත මාවත කාගිල්ස් ඉදිරිපිට සමරජීව මහතාගේ නිවාස වලට යාමට ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
4. කසළ කළමනාකරණ සැලැස්ම විධිමත් කිරීම සහ කසළ බද්ද එකතු කිරීම විධිමත් කිරීම
   නගර සභාව විසින් පුරා වසර 10ක් තුළ ක්‍රියාත්මක කරන ලද කසළ කළමනාකරණ සැලැස්ම සංවර්ධනය කිරමේ අරමුණ පෙරදැරි කරගෙන සහ දැනට පනවා ඇති කසළ බද්ද අය කිරීමේ දී සිදු වී ඇති අපහසුතා මගහරවා ගැනීම සඳහා 2013 වර්ෂයේ ජනවාරි මස සිට පහත සඳහන් වැඩසටහන අනුමත කර ගැනීමටත් එම වැඩසටහන 2013 මාර්තු මස 01 වන දින සිට කියාත්මක වන පරිදි කටයුතු කිරීමටත්, නිවාස මට්ටමෙන් කසළ එකතු කිරීම විධිමත් කිරීම සඳහාත් පහත යෝජනාව ඉදිරිපත් කරමි.

   - කසළ වෙන් කිරීමේ වැඩසටහනේ දිරන කසළ වෙනුවෙන් නගර සභාව යනුවෙන් මුද්‍රණය කරන ලද 2 kg, 5 kg, 10 kg ප්‍රමාණයන් දැමිය හැකි පොලිතින් මලු හඳුන්වා දීම.
   - මේ යටතේ මුල් වටයේ දී පොලිතින් මලු 100,000.00ක් මුද්‍රණය කර ලබා ගන්නා අතර, එම මලු නගරයේ වෙළඳ සැල් මගින් අලෙවි කිරීම.
   - මෙම මලු සඳහා මිල නියම කිරීමේ දී නිෂ්පාදන වියදමට එහි ලාභය සහ අදාල කසළ බද්ද එකතු කිරීම.
   - මෙම ක්‍රමය හඳුන්වා දීමෙන් පසු කසළ එකතු කිරීමේ දී මෙම මලු වලින් ලබා දෙන කසළ පමණක් භාර ගැනීම.

ඉහත යෝජනාවන් ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වෙනත් යෝජනා ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:02 ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා**

1. අබලන් තත්ත්වයට පත්ව ඇති පල්ලෙකුඹුර මාර්ගය පිළිසකර කිරීම
2. නගර සභාවට අයත් කඩ කාමර බදු දීමේ දී නීත්‍යානුකූල පිළිගත් ටෙන්ඩර් පටිපාටියකට අනුකූලව ටෙන්ඩර් කිරීම
3. බස් නැවතුම්පොල දෙපස සිට ජේ. එෆ්. හන්දිය දෙසට රථවාහන ධාවනය නැවැත්වීම
4. උඩ ඇල්ලෙපොල මහමෙව්නා මාවතේ අනතුරුදායක ලෙස පැමිණෙන වාහන වල වේගය අඩු කිරීමට බාධක ගැටිති යෙදීම.

ඉහත යෝජනාවන් මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාවන් අතරින් 1. හා 2. යෝජනාවන් සිදු කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය හිමි වූ අතර, 3. හා 4. යෝජනාවන් හි දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා රථවාහන පොලිසියට දැනුම් දීමට තීරණය විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2012 නොවැම්බර් ලැබීම් විග්‍රහය

- 2012 නොවැම්බර් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය සභාවේ අනුමත **විය.**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 5,401,203.18 |
| වෙනත් ලැබීම් | 3,093,782.20 |
| **මුළු ලැබීම්** | **8,494,985.38** |
| පුනරාවර්තන වියදම් | 2,582,443.33 |
| වෙනත් වියදම් | 880,324.46 |
| මුළු වියදම් | **3,462,767.79** |

- බලන්ගොඩ තානායමේ 2012.11.01 සිට 2012.11.30 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවේ අනුමත විය.

### 12:02 2012.11.01 සිට 2012:11.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව

2012.11.01 සිට 2012:11.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 365,787.70කි

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. 2013 වර්ෂය සඳහා කාරක සභා සාමාජිකයන් පත් කිරීම

### 13:01 ආපදා කළමනාකරණ කමිටුව සඳහා සාමාජිකයන් නම් කිරීම

බලන්ගොඩ නගර සභාවේ ආපදා කළමනාකරණය සම්බන්ධ සභා තීරණ ගැනීමට සහය වීමට සහ සභාවට ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට ආපදා කළමනාකරණ කමිටුවක් පත් කිරීම සඳහා ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමනක් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, පහත පරිදි එම කමිටුව සඳහා සාමාජිකයන් පත් කිරීමට මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

- ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා - ගරු ගරු සභාපති සහ කමිටුවේ සභාපති
- එම්. ඒ. එන්. ප්‍රේමතිලක මතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ කමිටු ලේකම්
- එම්. ටී. එම්. රූමි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී සහ කමිටු සාමාජික
- නිමල් කරුණාරත්න මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී සහ කමිටු සාමාජික
- එම්. ජේ. මලික් ෂා මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී සහ කමිටු සාමාජික
- ස්ථානාධිපති, බලන්ගොඩ පරිසර පොලිසිය - කමිටු සාමාජික
- යූ. වී. දැල බණ්ඩාර මහතා - වැඩ අධිකාරි සහ කමිටු සාමාජික
- එස්. එම්. එස්. ආනන්ද මහතා - ආදායම් පරීක්ෂක සහ කමිටු සාමාජික
- පරිසර නිලධාරී, බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කමිටු සාමාජික
- එම්. කේ. ජේ. නිශ්ශංක මහතා - කාර්මික නිලධාරී, බලන්ගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය, - කමිටු සාමාජික
- ඒ. බී. එස්. බණ්ඩාරවත්ත මහතා - ජ්‍යෙෂ්ඨ පුරවැසි සහ කමිටු සාමාජික
- කුසුමා අබේසිංහ මිය - පරිසර ක්‍රියාකාරිනී සහ කමිටු සාමාජික
- කවිරාජ් ගුණතිලක මහතා - ආයුර්වේද වෛද්‍යාචාර්ය සහ කමිටු සාමාජික
- මංජු විදානගමාච්චි මහතා – UN-Habitat

**13:02 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව**

බළන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහාත් පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:03 පරිසර උපදේශන කාරක සභාව**

බළන්ගොඩ නගර සභාවේ පරිසර උපදේශන කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:04 ප්‍රසම්පාදන මණ්ඩලය**

බළන්ගොඩ නගර සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:05 කර්මාන්ත කාරක සභාව**

බළන්ගොඩ නගර සභාවේ කර්මාන්ත කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:06 තානායම් කාරක සභාව**

බළන්ගොඩ නගර සභාවේ තානායම් කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:07 මුදල් කාරක සභාව**

බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:02 පුස්තකාල උපදේශන කාරක සභාව**

බළන්ගොඩ නගර සභාවේ පුස්තකාල උපදේශන කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 14. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**14:01 මුදල්, ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව**

2012.12.19 වන දිනැති මුදල්, ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**14:01 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තාව**

2012.12.20 වන දිනැති සෞඛ්‍ය හා ඝනඅපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 15. වැය මාරුව ඉදිරිපත් කිරීම:

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් මේ වර්ෂයට අදාල වැය මාරුව මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරෝධතාවයක් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 16. වෙනත් කරුණු:

**16:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා:**

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා සභාව අමතමින්, පල්ලෙවෙල කර්මාන්තය සඳහා වැලි ලැබුණු බවත්, දැන් එම කර්මාන්තය සිදුවෙමින් පවතින බවත්, ඒ සම්බන්ධව තමන්ගේ ස්තුතිය පුද කරන බවත් දැන්වීය. ඒ සඳහා සිමෙන්ති ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටියේය. එමෙන්ම තුඹගොඩ සුදර්ශන විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන මිහිඳු පෙරහැර සඳහා නගර සභාවේ දායකත්වය සෑම වතාවකම ලබා දුන් බවත්, මෙවර මිහිඳු පෙරහැර සඳහා සුභසාධන කටයුතු වලට නගර සභාවෙන් වෙන් කර ඇති මුදලින් රු. 50,000.00ක් ලබා දීමට යෝජනා කරන බවත් සඳහන් කළේය.

සුදර්ශන පුර ජල ප්‍රශ්නය විසඳීම සඳහා ගරු සභාපතිතුමන්ට මැදිහත් වන මෙන් ද ඉල්ලා සිටියේය. එමෙන්ම මෙම සභාවේ දී භික්ෂූන් වහන්සේලාට නිසි ගෞරවය ලැබෙන පරිද්දෙන් සංවාද සිදුවිය යුතු බව පෙන්වා දුන්නේය. 2013 වර්ෂයේ ඉතාමත් සාර්ථකව මෙම සභාවේ කටයුතු සිදු කිරීම ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රීතුමන්ලාට හැකියාව ලැබෙනු ඇතැයි ප්‍රාර්ථනා කරමින් සිය කථාව අවසන් කරන ලදී.

ගරු උපසභාපතිතුමන් විසින් සිදු කරන ලද යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් තුඹගොඩ සුදර්ශන විහාරයේ මිහිඳු පෙරහැර සඳහා සුභසාධන කටයුතු වලට වෙන් කර ඇති මුදලින් රු. 50,000.00ක් ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**16:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා සභාව අමතමින්, නගර වාසී ජනතාවට විශාල සේවාවක් සිදු කිරීමට 2013 වර්ෂයේ දී මෙම සභාවට හැකි වූ බවත්, මේ වන විට බලන්ගොඩ නගර සභාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර මට්ටමෙන් ද කතා බහට ලක්වන බවත්, ඒ සම්බන්ධව නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් ආඩම්බරයට පත් වන බවත්, එය බලන්ගොඩ ප්‍රදේශවාසීන්ට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවේම ජනතාවට ආඩම්බරයට කරුණක් බවත් ප්‍රකාශ කළේය. බලන්ගොඩ ප්‍රදේශයේ සිංහල බෞද්ධ ජනතාව සමඟ මුස්ලිම් ජනතාව සහෝදරත්වයෙන් ජීවත් වීම සම්බන්ධව ඉන්දුනීසියාවේ ප්‍රොබොලිංගො මහ නගර සභාවෙන් පැමිණි ගරු නගරාධිපතිතුමන් ඇතුළු පිරිස ප්‍රසාදය පළ කළ බව ද සඳහන් කළේය. මෙම කාර්යයන්ට පක්ෂ බේදයකින් තොරව ගරු සභාපතිතුමන් ලබා දුන් නායකත්වය විශිෂ්ට බව ද, ඒ සම්බන්ධව තමන්ගේ ස්තුතිය පුද කරන බව ද ප්‍රකාශ කළේය.

**16:03 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාව අමතමින් කරදියමුල්ල මාර්ගය ඉතා අබලන්ව තිබූ මාර්ගයක් බව ද, මේ වන විට සබරගමුව පළාත් මාර්ග ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ද මැතිතුමාගේ මැදිහත් වීමෙන් එය සකස් කර ඇති බවත්, ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කළේය.

**16:04 ගරු නාගරික ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභාව අමතමින්, ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඌරු මස් කඩයක් විවෘත කිරීම සම්බන්ධ යෝජනාවේ දී විරුද්ධ වූයේ දේශපාලනික හේතු මුල් කරගෙන නොවන බව ප්‍රකාශ කළේය. නගරයේ පොදු කටයුතු වල දී වැඩිම ප්‍රමාණයක් ආධාර ලබා දෙන්නේ මුස්ලිම් ජනතාව බව ද, සමාජ සේවා පදනමේ භාණ්ඩාගාරිකවරයා වශයෙන් තමා ඒ සම්බන්ධව හොඳින් දැන සිටින බව ද ප්‍රකාශ කළේය. බොහෝ කාලයක සිට බලන්ගොඩ නගරයේ ගව මස් වෙළඳසැල් තිබූ බව ද, එසේ වුවත් වර්තමානයේ මස් ආහාරයට නොගන්නා පිරිස වැඩි බව ද සඳහන් කළේය.

එමෙන්ම බලන්ගොඩ ළමා උද්‍යානය කාටත් ප්‍රයෝජනවත් ස්ථානයක් වශයෙන් ගොඩ නැංවීමට ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාගේ සහයෝගය බලාපොරොත්තු වන බව ද වැඩි දුරටත් සඳහන් කළේය.

**16:05 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාව අමතමින්, බලන්ගොඩ තුඹගොඩ සාංඝික විහාරස්ථානයේ ඉඩම හරහා නගරයේම අපද්‍රව්‍ය ගලා යන බව ද ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගැනීම සිදු කළ යුතු බව ද ප්‍රකාශ කළේය. එමෙන්ම පසුගිය වසරේ සභා අරමුදල් වලින් මෙන්ම මග නැගුම, ගම නැගුම වැනි ව්‍යාපෘතින් හරහා ද ජනතාවට සේවයක් සිදු කිරීමට හැකියාව ලැබීම සම්බන්ධයෙන් සතුටට පත් වන බව ද ප්‍රකාශ කළේය.

**16:06 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා සභාව අමතමින්, දේශපාලන ක්ෂේත්‍රයේ බිම් මට්ටමේ සිටින මන්ත්‍රීවරුන් වශයෙන් නාගරික මන්ත්‍රීතුමන්ලා හට ද මධ්‍යම රජයෙන් සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කරන්නේ නම් ඉතා වැදගත් වන බව ප්‍රකාශ

කළේය. එමෙන්ම පක්ෂ බේදයකින් තොරව ගරු සභාපතිතුමන් විසින් අවශ්‍ය ඕනෑම අවස්ථාවක මහජන කාර්යයන් සඳහා සහයෝගය ලබා දීම සම්බන්ධව එතුමන් හට ස්තුතිවන්ත විය යුතු බව ද වැඩි දුරටත් සඳහන් කළේය. එමෙන්ම කහටපිටිය මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා ලබන වර්ෂයේ දී ප්‍රමුඛතාවයක් ලබා දීම අවශ්‍ය කරුණක් බවද සිහිපත් කළේය.

**16:07 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් සභාව අමතමින්, දොරවෙල ප්‍රදේශයේ පානීය ජල ටැංකිය සම්බන්ධ ප්‍රශ්නයට තමන් සම්බන්ධ වූයේ ගරු සභාපතිතුමන් අපහසුතාවයට පත් කිරීමට නොව, ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමන් විසින් සිදු කරන ලද ඉල්ලීමට අනුව බව සඳහන් කළේය.

බළන්ගොඩ නගර සභාවට ජාතික මට්ටමේ ජයග්‍රහණ ලබා ගැනීමට ක්‍රියාකරන ලද ගරු සභාපතිතුමන් ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන බව ද, එමෙන්ම 2012 වර්ෂයේ දී බළන්ගොඩ නගරයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබා දෙන ලද, පාර්ලිමේන්තු ගරු මන්ත්‍රී රන්ජන් රාමනායක මැතිතුමා, පළාත් සභා අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා ඇතුළු පළාත් සභා ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ගරු සභාපතිතුමන්ටත්, එයට සම්බන්ධව සහය දුන් ප්‍රාදේශිය ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, නගර සභාවේ කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පල කරන බව ප්‍රකාශ කළේය.

## 17. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

2012 වර්ෂය ඉතාමත් සාර්ථකව ජනතාවට සේවාවක් සිදු කිරීමට අතිගරු ජනාධිපතිතුමා, ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා සහ ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා, පළාත් සභා ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා ඇතුළු නොයෙක් ආකාරයෙන් සහය දුන් සියළුම දෙනාට ස්තුතිවන්ත වන බව ද, ලබන වසරේද ජනතාවට සේවය සැලසීම සඳහා අප ධෛර්යමත් කරමින් කටයුතු කිරීමට හැකි වේවා යැයි ද ප්‍රාර්ථනා කළේය. එමෙන්ම සියළු දෙනාටම සුභ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් සභාවේ වැඩ කටයුතු ප. ව. 1.30ට පමණ අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.